www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සසප 2004 උද්ඝෝෂනයඃ එලඹෙන අරගලවලට සූදානම් වීමක්

## The SEP's 2004 campaign: a preparation for coming battles

**සසප ජනාධිපති අපේක්ෂක බිල් වෑන් ඕකන් විසිනි**
**2004 නොවැම්බර් 5**

2004 මැතිවරන දැන් හමාර වී ඇත. බුෂ් ආන්ඩුව දෙවන වාරය සඳහා ජය ගෙන ඇත. එම පාලන කාලය තුල දී සිය භූගෝලීය මිලිටරි ආක්‍රමන තව දුරටත් වර්ධනය කිරීමත් ඇමරිකාවේ වැඩ කරන ජනතාවගේ සමාජ කොන්දේසිවලට හා ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි සිය ප්‍රහාර උත්සන්න කිරීමත් බුෂ් ආන්ඩුවේ එල්ලය ලෙස පවතී.

ඩිමොක්‍රැටික් පක්ෂය ජනාධිපති ඡන්දයෙන් පරාජයට ඇද වැටී පමනක් නොව සෙනෙට් සභාව හා නියෝජිත මන්ත්‍රී මන්ඩලය යන දෙකම තුල සිය පදනම් අහිමි වීමට ලක්ව, නින්දිත පරාජයකට මුහුන පා තිබේ.

ඩිමොක්‍රැටික් පක්ෂය ආන්ඩුවේ ප්‍රතිගාමී පිලිවෙත් ආපසු හැරවීම සඳහා දේශපාලන උපකරනයක් ලෙස සේවය කරනු ඇතැයි යන මිථ්‍යාවේ ගිලී සිටි කෝටි සංඛ්‍යාත මහජනයා ඉදිරියේ මෙම පක්ෂය අපකීර්තියට ලක්ව ඇත. විරුද්ධ පක්ෂය ලෙස පෙනී සිටින එය මෙම කිසිදු පිලිවෙතකට බැරෑරුම් විරුද්ධත්වයක් මතු කිරීමෙහි ලා අපොහොසත් බව මැතිවරනයෙන් ඔප්පු විය.

සමාජවාදී සමානතා පක්ෂය තමන්ගේ පාර්ශ්වයෙන් වැදගත් ජයග්‍රහනයක් තහවුරු කරගෙන ඇත. අපගේ මැතිවරන උද්ඝෝෂනය දියත් කිරීමේ දී අප ඉදිරිපත් කල ඉදිරිදර්ශනය බලගතු ලෙස සනාථ වී තිබේ. ආරම්භයේ පටන් ම අප කියා සිටියේ, යුද්ධයට හා ප්‍රතිගාමිත්වයට එරෙහි අරගලය ඉදිරියට ගෙන යා හැක්කේ ද්වි-පක්ෂ ක්‍රමයෙන් බිඳී වෙන් වී ලාභ ගරන පද්ධතියට එරෙහිව කම්කරු පන්තියේ ස්වාධීන පක්ෂයක් ගොඩනැගීම හරහා ම පමනක් බව යි.

අපගේ අපේක්ෂකයන් ලබා ගත් ඡන්ද ප්‍රමානයන් සාපේක්ෂව කුඩා වන නමුදු අපගේ උද්ඝෝෂනයේ දේශපාලන අන්තර්ගතය මහා ව්‍යාපාරිකයන්ගේ පක්ෂ දෙකේ ම බේගල්වලට හා වාචාල කතාවලට බලගතු ලෙස ප්‍රතිකූලව නැගී සිටී. එය දේශපාලන විවාදයේ මට්ටම ඉහල දැමීමට ද සමාජ හා දේශපාලන අර්බුදයේ ස්වභාවයත් එයට මුහුන දීමට අවශ්‍ය වන සමාජවාදී හා ජාත්‍යන්තරවාදී ක්‍රියාමාර්ගයත් පිලිබඳව වැඩ කරන ජනයාගේ, ශිෂ්‍යයන්ගේ හා තරුනයන්ගේ සැලකිය යුතු තට්ටුවක් උගන්වා ගැනීමට ද ක්‍රියා කොට ඇත.

බුෂ්, උප ජනාධිපති චෙනී සහ පාලනාධිකාරයේ සෙසු පුද්ගලයන් කියා සිටින්නේ මැතිවරන ප්‍රතිඵල වනාහි සිය මිලිටරිවාදී හා යුද්ධ පිලිවෙත් ඉදිරියට ගෙන යාමටත් විසි වන සියවස තුල දී ක්‍රියාවට දැමුනු සමාජ ප්‍රතිසංස්කරන හා සංගතවල බලය සීමා කරන පිලිවෙත් සියල්ල අහෝසි කිරීමට සම වන දේශීය වැඩපිලිවෙලක් ආරම්භ කිරීමටත් ලැබුනු මහජන වරමක් බව ය.

ප්‍රථම කොට ම, ඔවුහු බදු නීති සංග්‍රහය "ප්‍රතිසංස්කරනය" කිරීමට යෝජනා කරයි. එයින් අදහස් කෙරෙන්නේ කම්කරුවන්ගේ ආදායම් මත වඩා දැවැන්ත බදු බරක් පටවන ගමන් සමුච්චිත ධනය මත පැනවෙන බදු, මුලුමනින් ම අහෝසි කිරීම නො වේ නම්, ඒවා බොහෝ සෙයින් කප්පාදු කිරීමකි. "හිමිකාර සමාජයක්" පිලිබඳ සටන් පාඨය යටතේ ඔවුන් ඉදිරියට තල්ලු කරන්නේ සමාජ සංරක්ෂන ක්‍රමය පුද්ගලීකරනය කිරීමේ හා විශ්‍රාමිකයන්ගේ සීමිත පාරිතෝෂික පවා වෝල් වීදියේ ලාභ අවශ්‍යතාවන්ට යටත් කිරීමේ වැඩපිලිවෙලකි. සමාජ සංරක්ෂන පද්ධතිය "ප්‍රතිසංස්කරනය", මෙඩිකෙයා වැනි හිමිකම් වැඩපිලිවෙලවල්වල ඉතිරි පහඳු සියල්ල අතුගා දැමීම සඳහා පූර්වාදර්ශයන් සකසනු ඇත.

බඳාදා පැවැත්වූ සිය ජයග්‍රාහී කතාවේ දී චෙනී කියා සිටියේ බුෂ් "මේ ජාතියේ අනාගතය වෙනුවෙන් පැහැදිලි න්‍යාය පත්‍රයක් මත නොවලහා ම" උද්ඝෝෂනය කල අතර "ජාතිය" ජනවරමක් දෙමින් ඔහුට ප්‍රතිචාර දැක්වූ බවයි.

මෙය බොරුවකි. රිපබ්ලිකන් උද්ඝෝෂනය උත්සාහ කලේ සර්වව්‍යාපී ත්‍රස්තවාදී තර්ජනයක් ගැන මතක් කරමින් ඇමරිකානු ජනතාව ත්‍රස්ත කිරීමට යි. සම-ලිංගික විවාහ, ගබ්සා කිරීම් සහ පාදක සෛල පර්යේෂන වැනි කාරනා සම්බන්ධයෙන් ආගමට හා සමාජ පසුගාමිත්වයට නරුම ලෙස ආයාචනා කිරීම මත එය වාරු විය.

මෙම පදනම මත බුෂ්ට ලැබුනු ව්‍යාකූල ඡන්දය දේශපාලන ජන වරමක් නො වේ. ඡන්දයෙන් රිපබ්ලිකන්වරු ලබා ගත් සාපේක්ෂව පටු ජයග්‍රහනය ඔවුන් 2000 මැතිවරනය කොල්ලකෑම මගින් උරුම

කෙරුනු දේශපාලන දුර්ගන්ධය දුරීභූත කිරීමට ප්‍රමානවත් නොවේ. මෙම පාලනාධිකාරය අපරාධකාරිත්වය හා බොරු මත පදනම් වූ ආන්ඩුවක් වූ අතර එය එසේ ම පවතිනු ඇත.

ඩිමොක්‍රැටික් ජනාධිපති අපේක්ෂක ජෝන් කෙරී, බදාදා බුෂ්ගේ මැතිවරන ජයග්‍රහනය පිලිගනිමින් කල කතාවේ දී, "පොදු ප්‍රයත්නයක්" ඉල්ලා සිටිමින් "එකමුතුකමේ" අවශ්‍යතාව තියුනු ලෙස මතු කොට "බෙදුනු පාර්ශ්වයන් ඈදාලීමට" පොරොන්දු විය. බුෂ් සිය දෙවන පාලන වාරය තුල දී "කාරුනික භාවයක්" පෙන්වනු ඇතැයි ඔහු වංචනික ලෙස යෝජනා කලේ ය.

කෙරී කතා කරන්නේ, බුෂ්ගේ පලමු පාලන වාරයේ කේන්ද්‍රීය පිලිවෙත්වලට. එනම් ඉරාකයේ යුද්ධයට, සිවිල් අයිතීන්ට එරෙහි ප්‍රහාරවලට සහ ධනය වැඩ කරන ජනතාවගෙන් දැවැන්ත පරිමානව මූල්‍ය ප්‍රභූව වෙත මාරු කිරීමට, ගැඹුරින් ම විරුද්ධ ජනගහනයේ පුපුල් තට්ටු වෙනුවෙන් නො වේ. ඊට ප්‍රතිකූලව, ඔහු ඉල්ලා සිටින්නේ එම පිලිවෙත් ම වඩා හොඳින් ක්‍රියාවට දැමීමට හැකි වනු පිනිස දේශපාලන සංස්ථාපිතය තුල එකමුතුකමක් ඇති කර ගත යුතු බවයි.

ඩිමොක්‍රැටික්වරුන් ඔහයියෝ ප්‍රාන්තයේ ඡන්ද මුලුමනින් ම ගනන් කල යුතු යයි ඉල්ලා සිටීම හෝ සෙසු ප්‍රාන්තවල සමහර ඡන්ද ගනන් නො කිරීම සහ මැතිවරන වංචා පිලිබඳ වාර්තා ගැන සොයා බැලීම හෝ ප්‍රතික්ෂේප කිරීම වනාහි බංකොලොත් හා නිවට මැතිවරන ව්‍යාපාරයක අවසාන ක්‍රියාව යි. ඔහයියෝ ප්‍රාන්තයේ ඡන්දයෙන් බුෂ් සියයට 2කින් කෙරීට පැරදී ප්‍රතිඵල අනෙක් අතට හැරී තිබුනේ නම් රිපබ්ලිකන්වරුන්ගේ ප්‍රතිචාරය සිතා ගත හැකි ය. 2000 වසරේ ෆ්ලොරිඩාවේ දී මෙන්, ඔවුහු සාධාරන හෝ අසාධාරන ක්‍රම මගින් ප්‍රාන්තයේ ඡන්ද සියතට ගනු පිනිස නීතිඥයන්ගෙන්, ශ්‍රේෂ්ඨාධිකරන විනිසුරන්ගෙන් හා දක්ෂිනාංශික මැරයන්ගෙන් සමන්විත හමුදාවක් ම බලමුලු ගන්වනු ඇත.

වඩාත් අති මූලිකව ගත් කල, ඩිමොක්‍රැටික්වරුන්ගේ යටත් වීම මෙම පක්ෂයේ සැබෑ සමාජ පදනම ප්‍රකාශයට පත් වීමකි. එම සමාජ පදනම මුල් බැස ඇත්තේ වැඩ කරන ජනතාව තුල නොව ඒ වෙනුවට පාලක ප්‍රභූවේ කොටස් සහ වඩාත් ම වරප්‍රසාදිත සමාජ ස්ථරයන් තුල ය. රිපබ්ලිකන්වරු සමග ඔවුන්ට පවත්නා උපායික මතභේද කෙතරම් උග්‍ර වුවත් ඩිමොක්‍රැටික්වරු එම මූල්‍ය කතිපයාධිකත්වයේ ම අති මූලික අවශ්‍යතා ආරක්ෂා කරති.

කෙරී එකමුතුකම සඳහා වූ සිය කැඳවුම අවධාරනය කලේ මෙසේ ප්‍රකාශ කරමිනි: "දැන් අන් කවර දාකටත් වඩා, අපගේ සොල්දාදුවන් අනතුරට ලක්ව සිටින තතු යටතේ, අපි එකාවන්ව නැගී සිට ඉරාකයේ දී ජය ගෙන ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය ජයග්‍රහනය කල යුත්තෙමු." ඔහු එමගින් එලඹෙන ලේ වැගිරීම සඳහා ඩිමොක්‍රැටික්වරුන්ගේ සහයෝගය සංඥා කලේ ය.

මැතිවරනය වනාහි ඉරාකයේ ගෙන යන සිය සාපරාධී යුද්ධයට සහයෝගය පිනිස ලද ජනමත විචාරනයක් යයි පාලනාධිකාරය සාවද්‍ය ලෙස කියා පායි. ඡන්ද ගනන් කිරීම යන්තම් හමාරව ඇති තතු යටතේ, තවත් ඉරාක ජීවිත බොහෝ සංඛ්‍යාවක් බිලිගෙන එක්සත් ජනපද සොල්දාදුවන්ගේ මරන සංඛ්‍යාවන් ද ඉහල දමනු ඇති මිලිටරි මෙහෙයුමක් දියත් කිරීමේ පෙන්ටගනය මේ වන විටත් යෙදී සිටී. බ්‍රහස්පතින්දා ෆලූජා නගරයට එරෙහිව ගොඩ බිමින් ප්‍රහාරයක් එල්ල කිරීමට සූදානම් වෙමින්, ඒසී-130 ප්‍රහාරක යානා නගරයට කාල තුවක්කු හා මැෂින් තුවක්කු උන්ඩ වරුෂාවක් එල්ල කල අතර යුද ටැංකි ද එම ප්‍රහාරයට ඒකාබද්ධ විය. මැතිවරනයේ දී බුෂ්ට පාඩු සිදු වෙතැයි බියෙන් එය අවසන් වන තෙක් මෙම මෙහෙයුම තාවකාලිකව අත්හිටුවා තිබුනි.

සමාජවාදී සමානතා පක්ෂය, 2004 මැතිවරන ව්‍යාපාරය තුල දී, ඉරාකයෙන් සියලු එක්සත් ජනපද හමුදා වහා ම හා කොන්දේසි විරහිතව ඉවත් කිරීම සඳහා උද්ඝෝෂනය කලේ ය. මෙය වනාහි ඇමරිකානුවන් මිලියන ගනනකගේ සහාය ලැබෙන ඉල්ලීමකි. එහෙත් එයට ද්වි-පක්ෂ ක්‍රමය තුල කිසිදු ප්‍රකාශනයක් අත් පත් කර ගත නො හැකි ය. ඉරාක ජනතාවට එරෙහි මිලිටරි ආක්‍රමනය උත්සන්න කිරීමට සෘජු ලෙස සමානුපාතිකව මෙම යුද්ධයට පවත්නා විරුද්ධත්වය ද තීව්‍ර වනු ඇති බව අපට විශ්වාස ය.

මැතිවරනය මගින් බුෂ් පාලනාධිකාරය අති මහත් ශක්තියක් ලබා ගෙන ඇතැයි මාධ්‍ය මගින් හුවා දක්වනු ලැබෙතත් එලඹෙන වසරේ දී ආන්ඩුවටත් ඇමරිකානු ජනතාවටත් දැවැන්ත අර්බුදයන්ට මුහුන දීමට සිදු වනු ඇත.

ඉරාකයේ එක්සත් ජනපද වාඩිලෑමට එරෙහි මහජන ප්‍රතිරෝධය ෆලූජා නගරයට කඩා වදින යුද ටැංකි මගින් තලා දැමිය නො හැකි වනු ඇත. ඊට ප්‍රතිකූලව, සිවිල් වැසියන් මහා පරිමානයෙන් මරා දැමීම, මැද පෙරදිග පුරා ම මහජන විරෝධය අවුලුවාලමින්, වඩා දැවැන්ත විරුද්ධත්වයක් ප්‍රකුපිත කරනු ඇත. ඉරාකය තුල විජිත තන්ත්‍රයක් ඇටවීමට වොෂිංටනය දරන ඉවක් බවක් නැති ප්‍රයත්නයන් නොවැලැක්විය හැකි ලෙස ම අපකීර්තිමත් අවසානයකට මුහුන දෙනු ඇත.

මෙම මිලිටරි මෙහෙයුම දැවැන්ත ජන ඝාතනයකි. දැන් තක්සේරු කෙරී ඇති පරිදි, එක්සත් ජනපද ආක්‍රමනයේ හා වාඩිලෑමේ ප්‍රතිඵලයක් ලෙස ඉරාක වැසියන් 100,000ක් ඝාතනය කර තිබේ. ඔවුන්ගෙන් අති මහත් බහුතරයක් සිවිල් වැසියන් ය. මෙම කොන්දේසි යටතේ රිපබ්ලිකන් පක්ෂය "සදාචාරමය සාරධර්ම" මත මැතිවරන උද්ඝෝෂනයක් ගෙන යාමත් ඒ අතර ම ඩිමොක්‍රැටික් පක්ෂය එය අනුකරනය කිරීමට උත්සාහ කිරීමත් අසික්කිත වැඩකි. රටක් හා එහි තෙල් සම්පත් අල්ලා ගනු පිනිස කාන්තාවන් හා ලමුන් සමූල ඝාතනය කිරීමේ සදාචාරය කුමක් ද?

ඉරාකයේ මිලිටරි මෙහෙයුම දිග හැරෙන්නේ

එක්සත් ජනපද ධනවාදය මූල්‍යමය ව්‍යසනයක් දෙසට ඇදී යන බව දක්වන සලකුනු ඒ සමග ම වැඩෙන තතු යටතේ ය. වොෂිංටනයට සිය පිම්බෙන අයවැය හිඟයන් පියවා ගැනීමට දිගට ම නය ගැනීමට හැකි වන පරිදි කොංග්‍රස් මන්ඩලය ඩොලර් ට්‍රිලියන 8.074 දක්වා උපරිම නය සීමාව ඉහල දැමිය යුතු යයි ඉල්ලමින් එක්සත් ජනපද ආන්ඩුව බංකොලොත් වීමක අද්දර සිටින බව බුෂ් පාලනාධිකාරය නිවේදනය කලේ මැතිවරනයට යන්තම් එක් දිනක් ඇවැමෙනි. මෙම අයවැය හිඟයන්, වාර්තාගත ජංගම ගිනුම් හිඟය සහ ඉහල යන තෙල් මිල ගනන් සමග එක්ව, ඩොලරයේ බිඳ වැටීමක තර්ජනය මතු කරන්නේ ගෝලීය පරිමාන ආර්ථික අර්බුදයක් මුදා හරිමිනි.

අපගේ මැතිවරන උද්ඝෝෂනයේ දේශපාලන වැඩ කටයුතු එලඹෙන මහජන සමාජ හා දේශපාලන අරගලවල පිපිරීම සඳහා සසප සූදානම් කර ඇති බව අපට විශ්වාස ය. උද්ඝෝෂනය අපගේ පක්ෂය සමාජවාදී ජාත්‍යන්තරවාදයේ ඉදිරිදර්ශනය මත වඩා දෘඩතරව මුල් බස්සවා ගැනීමෙහි ලා දායක විය. අපගේ ක්‍රියාමාර්ගය සඳහා කල අරගලයේ දී අප සටන් වැදුනේ එක්සත් ජනපදයේ වැඩ කරන ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් පමනක් නොව එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ මිලිටරි හා ආර්ථික පිලිවෙත්වල ප්‍රතිවිපාකයන් අත් විඳින ලොව පුරා කම්කරු හා පීඩිත මහජනතාවගේ අවශ්‍යතා ද වෙනුවෙනි. අපගේ පක්ෂය කම්කරු පන්තියේ ජාත්‍යන්තර ඒකාබද්ධතාව සඳහා අරගලය සිය උද්ඝෝෂනයේ අක්ෂය බවට පත් කර ගත්තේ ය.

මැතිවරනයට පෙර අවසන් සති කිහිපය තුල දී, ඉරාක යුද්ධය හා 2004 මැතිවරනය පිලිබඳ සසප ආකල්පය අරබයා බ්‍රිතාන්‍යයේ හා ශ්‍රී ලංකාවේ කම්කරුවන්, ශිෂ්‍යයන් හා වෘත්තිකයන් ඇමතීමේ මහා වරප්‍රසාදය මට ලැබුනි. අධිරාජ්‍යවාදයට එරෙහිව ලෝක පරිමාන ව්‍යාපාරයක කොටසක් ලෙස එක්සත් ජනපදය තුල මහජන ස්වාධීන සමාජවාදී පක්ෂයක් ගොඩනැගීමේ ඉදිරිදර්ශනය එම දෙරට තුල ම බලගතු ආකර්ෂනයක් දිනා ගැනීමට සමත් විය. බුෂ්, කෙරී සහ එක්සත් ජනපද පාලක ප්‍රභූව විසින් ආරක්ෂා කරනු ලබන අවශ්‍යතාවලට වෛෂයිකව විරුද්ධ අවශ්‍යතා සහිත අති මහත් සමාජ බලවේගයක්, එනම් ඇමරිකානු කම්කරු පන්තිය, අධිරාජ්‍යවාදයේ මධ්‍යස්ථානය තුල ම පවතින බව අවබෝධ කර ගැනීම ලොව පුරා මහජනතාව සම්බන්ධයෙන් විප්ලවවාදී අර්ථභාරයක් සහිත කාරනාවකි.

ජාත්‍යන්තර ඉදිරිදර්ශනයක් සඳහා අපගේ පක්ෂය ගෙන යන අරගලය එක්සත් ජනපදය තුල ඉහල මට්ටමේ උනන්දුවක් හා සහයෝගයක් දිනා ගැනීමට සමත් වීම වනාහි, එක්සත් ජනපදය තුල පන්ති අරගලයේ යම් වර්ධනයකට ප්‍රතිචාර ලෙස ජාත්‍යන්තර පරිමානව මහජන අරගල පැන නගින බවට දර්ශකයකි.

උද්ඝෝෂනය තුලින් සැලකිය යුතු නව ආධාරකරුවන් ස්ථරයක් දිනා ගැනීමට අපගේ පක්ෂය සමත් විය. ප්‍රජාතන්ත්‍ර විරෝධී ඡන්ද නීතිවලට ද ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන් යන දෙපාර්ශ්වයේ ම නිලධාරීන්ගේ කැත උපායන්ට ද මුහුන දෙමින් අපගේ අපේක්ෂකයන්ගේ නම් ඡන්ද පත්‍රිකාවලට ඇතුලු කර ගැනීමට සසප ගෙන ගිය අසීරු අරගලයට බොහෝ දෙනෙක් සහභාගි විය, නැත හොත් එම අරගලයට දේශපාලනිකව සහයෝගය දුනි. පවත්නා දේශපාලන පද්ධතියේ ස්වභාවයත් එක්සත් ජනපදයෙහි සමාජ ධ්‍රැවාන්තගතවීමේ වර්ධනය තුල මුල් බැස ඇති ප්‍රජාතන්ත්‍ර අයිතීන්හි ප්‍රගාඪ බාදනයත් පිලිබඳව බොහෝ දෙනෙකු උගන්වා ගැනීමට මෙම අරගලය දායක විය.

සමාජවාදී සමානතා පක්ෂය බුෂ් පාලනාධිකාරයේ මැතිවරන ජයග්‍රහනයන්ගෙන් බියට පත් වන්නේ නැත. මෙම ආන්ඩුවට යටින් පවත්නා ගැඹුරු ආර්ථික, සමාජ හා දේශපාලන ප්‍රතිවිරෝධතා මහජන අරගලවල නව රැල්ලක් පැන නැගීමට තුඩු දෙනු ඇති බව අපට විශ්වාස ය. සමාජවාදය සඳහා අරගලය තුල වැඩ කරන ජනතාවගේ නව මහජන දේශපාලන ව්‍යාපාරයක ඉස්මතු වීම සඳහා දේශපාලන පදනම් දමනු පිනිස අපි 2004 මැතිවරන යොදා ගෙන තිබේ. අපගේ ක්‍රියාමාර්ගය පුලුල්ව ප්‍රචාරය කිරීමත් ඇමරිකානු කම්කරුවන්ගේ අරගල ලොව පුරා වැඩ කරන ජනතාවගේ අරගල සමග ඒකාබද්ධ කිරීමත් පිනිස *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* භාවිත කරමින්, නොවැම්බර් 2 මැතිවරනයෙන් අනතුරුව එම ප්‍රයත්නයන් ඉදිරියට ගෙන යාමටත් ශක්තිමත් කිරීමටත් අපි පියවර ගන්නෙමු.

අපගේ පක්ෂය හුදු මැතිවරන සඳහා වන පක්ෂයක් නො වේ. මැතිවරනවලට වැදගත් ක්‍රියාකලාපයක් ඉටු කල හැකි නමුදු අපගේ මැදිහත්වීම එල්ල කෙරී ඇත්තේ සංවිධානය, බලමුලු ගැන්වීම හා අන් සියල්ලටමත් වඩා අධ්‍යාපනය දෙසට ය. මෙම වැඩ කටයුතු ඉදිරියට යනු ඇත. එලඹෙන මාස ගනනාව තුල අපි මෙම මැතිවරනයේ පාඩම් උකහා ගෙන සමාජවාදී සමානතා පක්ෂය ගොඩනැගීමේ වැඩ කටයුතු ඉදිරියට ගෙන යනු ඇත. 2004 මැතිවරන උද්ඝෝෂනය තුල ආරම්භ කෙරුනු වැඩ කටයුතු ඉදිරියට ගෙන යාම අපගේ අභිප්‍රාය වන අතර මෙම කර්තව්‍යයට සහභාගි වන ලෙස අපගේ සියලු පාඨකයන්ගෙන් අපි ඉල්ලා සිටිමු. ඉදිරියට පැමින, සසපට බැඳී සමාජවාදය සඳහා අරගලය අතට ගන්නා ලෙස අපි ඔබගෙන් ඉල්ලා සිටිමු.